# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 63 දරන
# සාත්තු නිවාස (පාලනය කිරීමේ) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිළ : ශත 30 යි.  තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 63 දරන සාත්තු නිවාස (පාලනය කිරීමේ) සංශෝධන) පනත.**

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 64/87

**සාත්තු නිවාස (පාලනය කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

1. මේ පනත 1988 අංක 63 දරන සාත්තු නිවාස (පාලනය කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාත්තු නිවාස (පාලනය කිරීමේ) පනතෙහි 11 වන වගන්තියේ "අධ්‍යක්ෂවරයා" යන්නෙහි අර්ථ නිරූපණය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **220 වන අධිකාරියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.**

> '"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;'.

3. (1) මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1985 ජූනි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස, සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. **සංශෝධනය අතීතගව බලපෑම.**

(2) මේ පනත ආරම්භ වීමට පෙරාතුව, 1985 ජූනි මස 1 වන දින සිට සහ ඉන් ඉක්බිතිව, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂජනරාල්වරයා විසින් කරන ලද යම් ක්‍රියාවක්, ඒ ක්‍රියාව කිරීමට ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ප්‍රධාන ප්‍රඥප්තිය මගින් බලය පවරා නොතිබුණේය යන හේතුව මත පමණක් බල රහිත නොවූ ලෙස හා නොවිය යුතු ලෙස සලකනු ලැබිය යුතුය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 236 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.